NALANDA COLLEGE NALANDA COLLEGE NALANDA COLLEGE

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

ඒකක පරීක්ෂණය

07 ශ්‍රේණිය | විද්‍යාව | ඒකකය 08 - පෘථිවියේ ස්වභාවය

## I කොටස

- **නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01) පෘථිවියේ පිටතම පිහිටි ස්තරය කුමක්ද?
1) ප්‍රාවරණය 2) කබොල 3) ඇතුලත හරය 4) හරය

02) ශ්‍රී ලංකාවේ භූ කම්පනමානයක් පිහිටුවා ඇති නගරය කුමක්ද?
1) මිහින්තලේ 2) අඹතලේ 3) තලවකැලේ 4) පල්ලෙකැලේ

03) ශ්‍රී ලංකාවට සුනාමි රළ මගින් හානි සිදුවූ දිනය නම්,
1) 2017 මැයි 25 2) 2005 දෙසැම්බර් 25
3) 2004 දෙසැම්බර් 26 4) 2009 මැයි 25

04) භූ තැටි චලනය වීම සිදුවන්නේ,
1) සුළගේ ශක්තියෙනි 2) චන්ද්‍රයාගේ ශක්තියෙනි
3) සූර්යයාගේ ශක්තියෙනි 4) මේ කිසිවක් නිසා නොවේ.

05) ශ්‍රී ලංකාව අයත් වන භූ තැටිය වන්නේ,
1) ඔස්ට්‍රේලියන් ඉන්දියන් භූතැටියට ය. 2) ඇන්ටාර්ටිකා භූ තැටියට ය.
3) පැසිපික් භූ තැටියට ය. 4) යුරෝපා භූ තැටියට ය.

06) පෘථිවි හරයේ ඝනකම වන්නේ,
1) 12 km 2) 2900 km 3) 35 km 4) 3500 km

07) පෘථිවි කබොලේ වැඩිපුරම ඇති මූලද්‍රව්‍යයන් නොවන්නේ,
1) කාබන් 2) සිලිකන් 3) ඇලුමිනියම් 4) ඔක්සිජන්

08) පහත වගන්ති වලින් වැරදි වගන්තිය කුමක්ද?
1) හරයේ ඇතුළත කොටස අධික පීඩනය නිසා ඝනව පවතී.
2) ප්‍රාවරණයේ පහළ කොටසේ පාෂාණ අධික උෂ්ණත්වය නිසා ද්‍රව තත්ත්වයේ පවතී.
3) ප්‍රාවරණයේ ඉහළ කොටස ද්‍රව තත්ත්වයේ පවතී.
4) හරයේ ඇතුළත කොටසේ සූර්යයාගේ මතුපිට තරම් අධික උෂ්ණත්වයක් ඇත.

09) පෘථිවිය සූර්යයාගේ සිට සලකන විට පිහිටා ඇති ස්ථානය වන්නේ,
1) දෙවන ස්ථානයේ 2) තුන්වන ස්ථානය
3) හතරවන ස්ථානය 4) පස්වන ස්ථානය

10) තැම්බූ බිත්තරයක් හරස් අතට කැපූ විට පෙනෙන දර්ශනයට අනුව, බිත්තරයේ සුදුමදය,
1) පෘථිවියේ හරයයි. 2) පෘථිවියේ කබොලයි
3) පෘථිවියේ ප්‍රාවරණයයි. 4) පෘථිවියේ ඇතුළත හරයයි.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!


Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

## II කොටස

**02) හිස්තැන් පුරවන්න.**

01) රූපයේ පෙන්වා ඇත්තේ පෘථිවියේ හරස්කඩකි. මෙහි A, B, C කොටස් නම් කරන්න.




A =......................................

B =......................................

C =......................................

02) භූ කම්පන හඳුනා ගැනීමට යොදාගන්නා උපකරණය වන්නේ,

..........................................................................................................................

03) ජීවීන්ගේ පැවැත්ම සඳහා සුදුසුම ග්‍රහලෝකය වන්නේ,

..........................................................................................................................

04) උතුරු ඇමෙරිකාවේ කැලිෆෝනියා ප්‍රාන්තරයේ පිහිටා ඇති ගොඩබිම පිහිටි දිගම භූ තැටි මායිම වන්නේ,

..........................................................................................................................

05) පෘථිවි හරයේ අඩංගු මූලද්‍රව්‍ය වන්නේ,

..........................................................................................................................

06) ප්‍රාවරණයේ ඇති පාෂාණ වල බහුලව අඩංගු මූලද්‍රව්‍ය වන්නේ,

..........................................................................................................................

07) පෘථිවියේ භූ තැටි එකිනෙකට සාපේක්ෂව ඉතා සෙමෙන් චලනය වේ. ඒ වසරකට කොපමණ ප්‍රාමණයකින්ද?

..........................................................................................................................

## III කොටස

01) අමු අලිපේර ගෙඩියක් හරස් අතට කපාගත් විට එය පෘථිවියේ අභ්‍යන්තර කොටස් සමඟ සංසන්දනය කළ හැක. එම අවස්ථාව ඇඳ කොටස් නම් කරන්න.

02) පෘථිවියේ භූ තැටි චලනය වීමට බලපාන හේතුව කුමක්ද?

03) භූ තැටි චලනය වන අතර ආදර්ශනයට ඝනකම පොතු සහිත දොඩම් ගෙඩියක් යොදාගන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

04) පෘථිවියේ අභ්‍යන්තර ස්වභාවය පිළිබඳ භූ විද්‍යාඥයින් විසින් තොරතුරු ලබාගන්නා ක්‍රම 2 කුමක්ද?

05) ''සැන් ඇන්ඩ්‍රියාස් විභේදය'' නම් භූ තැටි මායිම දෙපස පිහිටා ඇති භූ තැටි දෙක නම් කරන්න.

06) ඔබ දන්නා භූ තැටි දෙකක නම් කරන්න.

*සැකසුම - කේ. වී. සී. ප්‍රියදර්ශනී මිය*